**ශීර්ෂය 285 - කෘෂිකර්ම දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

---

ශීර්ෂය 285 - කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම, ආදායම් ගිණුම, වාණිජ අත්තිකාරම් ගිණුම, ගනුදෙනු බේරා වසා දැමීමේ කටයුතු කරගෙන යාම සඳහා අත්තිකාරම් ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 අගෝස්තු 03 දින දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම**

---

විසර්ජන ගිණුම, ආදායම් ගිණුම, වාණිජ අත්තිකාරම් ගිණුම, ගනුදෙනු බේරා වසා දැමීමේ කටයුතු කරගෙන යාම සඳහා අත්තිකාරම් ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

---

**2.1 විසර්ජන ගිණුම**

---

**(අ) මුළු ප්‍රතිපාදනය හා වියදම**

---

දෙපාර්තමේන්තුව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 6,138.25 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 5,785.70 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 352.55 ක් හෙවත් සියයට 5.74 ක ප්‍රතිපාදන ඉතිරිවී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2015 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 4,057.90 | 3,978.91 | 78.99 | 1.94 |
| මූලධන | 2,080.35 | 1,806.79 | 273.56 | 13.14 |
| **එකතුව** | **6,138.25** | **5,785.70** | **352.55** | **5.74** |

**(ආ) වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය**

විවිධ කාර්යයන් සඳහා දෙපාර්තමේන්තුව වෙත වෙනත් අමාත්‍යාංශ 02 ක් විසින් එකතුව රු.මිලියන 379.98 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 261.44 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව එක් අමාත්‍යාංශයක් විසින් සලසා තිබුණු මුළු ප්‍රතිපාදනයම උපයෝජනය කර තිබුණු අතර අනෙක් අමාත්‍යාංශය විසින් සලසා තිබුණු ප්‍රතිපාදනවලින් රු.මිලියන 118.54 ක් හෙවත් සියයට 32 ක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි.

## 2.2 ආදායම් ගිණුම

**ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම**

දෙපාර්තමේන්තුව විසින් 2015 වර්ෂය සඳහා ආදායම් සංකේත 20.03.02.18 සඳහා රු.මිලියන 220 ක ආදායම් ඇස්තමේන්තු කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ දී එකතුව රු.මිලියන 268 ක ආදායම් රැස්කර තිබුණි. එය ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 122 ක් වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| ආදායම් සංකේතය | 2015 දෙසැම්බර් 31 දිනට | | | ඉක්මවීම ඇස්තමේන්තුවේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ඇස්තුමේන්තුගත ආදායම | තත්‍ය ආදායම | ඉක්මවීම | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 20.03.02.18 | 220 | 268 | 48 | 22 |

**2.3 අත්තිකාරම් ගිණුම්**

**2.3.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දෙපාර්තමේන්තුවට අදාළ විෂය අංක 28501 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** |
| 230.00 | 181.88 | 145.19 | 184.50 | 500.00 | 401.58 |

**2.3.2 වාණිජ අත්තිකාරම් ගිණුම**

**(අ) පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දෙපාර්තමේන්තුව විසින් පවත්වා තිබුණු විෂය අංක 28502 දරන වාණිජ අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 510.00 | 502.75 | 416.00 | 465.76 | 70.00 | 24.12 |

**(ආ) මූල්‍ය ප්‍රතිඵල**

විෂය අංක 28502 දරන වාණිජ අත්තිකාරම් ගිණුමේ මූල්‍ය ප්‍රතිඵල පහත පරිදි විය.

| **අත්තිකාරම් ගිණුම් කටයුත්ත** | **මූල්‍ය ප්‍රතිඵල** | | | |
|---|---|---|---|---|
| | **2015** | | **2014** | |
| | **පාඩුව කල්පිත ගාස්තු රහිතව** | **පාඩුව කල්පිත ගාස්තු සහිතව** | **ලාභය කල්පිත ගාස්තු රහිතව** | **ලාභය කල්පිත ගාස්තු සහිතව** |
| | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** |
| කෘෂිකාර්මික ගොවිපල නඩත්තුව හා බීජ අලෙවි අත්තිකාරම් ගිණුම | 22.75 | 68.04 | 170.96 | 138.01 |

## 2.4 අග්‍රිම ගිණුම

දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනට අංක 7002/0000/00/0081/0015/000 දරන අග්‍රිම ගිණුමේ ශේෂය රු.මිලියන 17.46 ක් විය.

## 2.5 පොදු තැන්පත් ගිණුම්

දෙපාර්තමේන්තුව යටතේ වන පොදු තැන්පත් ගිණුම් 06 ක 2015 දෙසැම්බර් 31 දිනට තැන්පත් ශේෂ එකතුව රු.මිලියන 46.96 ක් විය. විස්තර පහත දැක්වේ.

| තැන්පත් ගිණුම් අංකය | 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | රු.මිලියන |
| 6000/000/00/0001/0046/000 | 1.44 |
| 6000/000/00/0002/0062/000 | 3.72 |
| 6000/000/00/0006/0086/000 | 5.58 |
| 6000/000/00/0013/0029/000 | 9.20 |
| 6000/000/00/0016/0015/000 | 25.40 |
| 6000/000/00/0018/0018/000 | 1.62 |
| **එකතුව** | **46.96** |

## 2.6 විගණන නිරීක්ෂණය

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම, ආදායම් ගිණුම, වාණිජ අත්තිකාරම් ගිණුම, ගනුදෙනු බේරා වසා දැමීමේ කටයුතු කරගෙන යාම සඳහා අත්තිකාරම් ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

## 3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් මුදල් රෙගුලාසි 454(2) ප්‍රකාරව විදුලි උපකරණ පිළිබඳ ලේඛනය පවත්වා නොතිබුණු අතර, 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව පරිගණක උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය විධිමත්ව හා යාවත්කාලීන කර පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

**3.2 විගණන විමසුම්වලට පිළිතුරු දීම**

දෙපාර්තමේන්තුව වෙත සමාලෝචිත වර්ෂයේදී ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 04 කට 2016 මාර්තු 31 දින වන විටද පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. එම විමසුම්වලට අදාළ ගණනය කළ හැකි ගනුදෙනුවල වටිනාකම රු.2,588,960 ක් වී තිබුණි.

**3.3 විසර්ජන ගිණුම**

**අයවැය විචලනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැය විෂයයන් 01 ක් සඳහා සලසා තිබුණු රු.10,000,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

(ආ) වැය විෂයයන් 28 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාළ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 14 ක සිට සියයට 64 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**3.4 පොදු තැන්පත් ගිණුම**

වර්ෂ 2 ක් ඉක්මවූ එකතුව රු.304,435 ක්වූ තැන්පතු 04 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**3.5 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

විෂය අංක 28501 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2015 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදි පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) ඉදිරිපත් කරන ලද සැසඳුම් ප්‍රකාශය අනුව එදිනට අයවීම් හිඟහිට තිබුණු අත්තිකාරම් ශේෂවල එකතුව රු.14,429,970 ක් වී තිබුණි. එය සමස්ථ ණය ශේෂයෙන් සියයට 3.5 ක් විය. තවද අයවීම් හිඟහිට ඇති මුළු ශේෂයෙන් රු.5,423,268 ක් වූ ණය ශේෂ වර්ෂ 03 කට වැඩි පැරණි ඒවා වූ අතර එය අයවීම් හිඟහිට ඇති සමස්ථ ණය ශේෂයෙන් සියයට 37 ක් විය. එම හිඟහිටි ණය ශේෂ සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

(ආ) නිලධාරින් 112 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු. 3,379,540 ක් වූ හිඟ හිටි ණය ශේෂ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.2.4, 4.2.5 හා 4.4 වගන්ති ප්‍රකාරව කටයුතු කර 2016 අගෝස්තු 25 දින වන විටත් අයකර ගැනිමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.

(ඇ) සේවය හැර ගිය නිලධාරින් 27 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.1,614,155 ක් වූ හිඟහිටි ණය ශේෂ වර්ෂ 3 ක සිට වර්ෂ 21 ක් දක්වා කාල පරාසයක් ඉක්මවා තිබුණද, එම ණය ශේෂ

සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.5 හා 4.6 වගන්ති අනුව කටයුතු කර ඇපකාරයන්ගෙන් හෝ උරුමක්කාරයන්ගෙන් අයකර ගැනීමටත්, එසේ අයකර ගැනීමට නොහැකි නම් නීතිපතිගෙන් උපදෙස් ලබාගැනීමටත් කටයුතු කර නොතිබුණි.

(ඈ) ස්ථාන මාරුවී ගිය වර්ෂ 01 ක සිට වර්ෂ 30 ක් දක්වා කාල පරාසයක් ගතවී තිබූ නිලධාරීන් 27 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු. 221,356 ක් වූ ණය ශේෂ නිරවුල් කර ගැනීම සම්බන්ධයෙන් 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

### 3.6 වාණිජ අත්තිකාරම් ගිණුම

සමාලෝචිත වර්ෂයේදී දෙපාර්තමේන්තුව විසින් අංක 28502 දරන වාණිජ අත්තිකාරම් ගිණුමේ කටයුතු ඉටු කර තිබුණි. විගණනය වෙත ඉදිරිපත් කළ එම ගිණුම සම්බන්ධයෙන් සිදු කළ නියැදි පරීක්ෂාවේදී අයවිම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.24,120,143 ක් වූ අතර, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

### 3.7 ගනුදෙනු බේරා වසා දැමීමේ කටයුතු කරගෙන යාම සඳහා අත්තිකාරම් ගිණුම්

අමාත්‍ය මණ්ඩල තීරණයක් අනුව අත්තිකාරම් ගිණුම් කාර්යයන් 05 ක ඇවර කිරීමේ කටයුතු දෙපාර්තමේන්තුව වෙත පවරා තිබුණු අතර, එම ඇවර කිරීමේ කටයුතු 1984 මැයි 23, 1991 දෙසැම්බර් 11 දින, 1996 දෙසැම්බර් 31 දින, 2000 මැයි 10 දින සහ 2003 අප්‍රේල් 09 දින යන දිනයන් වන විට අවසන් කළ යුතුව තිබුණි. එහෙත් 2015 දෙසැම්බර් 31 දින වන විටත් එම ඇවර කිරීමේ කටයුතු නිම කර නොතිබුණි. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ගනුදෙනු බේරා වසා දැමීමේ කටයුතු කරගෙන යාම සඳහා අත්තිකාරම් ගිණුම් 04 කට අදාළ අනුමත නොකළ සමුච්චිත කාරක පාඩු එකතුව රු.65,842,264 ක් වී තිබුණි.

(ආ) ගනුදෙනු බේරා වසා දැමීමේ කටයුතු කරගෙන යාම සඳහා අත්තිකාරම් ගිණුම් 01 කට අදාළ වර්ෂ 15 ක් කල් ගතවී තිබුණු රු.1,303,832 ක හිඟහිටි ශේෂද, වර්ෂ 16 ක් කල්ගතවී තිබුණු රු.76,157 ක්වූ පියවිය යුතු ශේෂද පැවතුණි.

### 3.8 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

**වාර්ෂික කාර්යසාධන වාර්තාව**

2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, එම වාර්තාව 2016 ජුනි 14 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

### 3.9 වත්කම් කළමනාකරණය

දෙපාර්තමේන්තුවේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

**(අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

පහත වර්ග කර ඇති පරිදි සමහර වත්කම් නිෂ්ක්‍රීයව හෝ ඌන උපයෝජිතව පැවති බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | වත්කම් වර්ගය | ඒකක ගණන | වටිනාකම | නිෂ්ක්‍රීය හෝ ඌන උපයෝජිතව පැවති කාලය | |
|---|---|---|---|---|---|
| | | | රු. | වර්ෂ 1 ට වැඩි 3 ට අඩු | වර්ෂ 3 ට වැඩි |
| (i) | ගොඩනැගිලි | 97 | ගණනය කර නොමැත. | - | 97 |
| (ii) | මෝටර් වාහන | 159 | - එම - | 06 | 153 |
| (iii) | යන්ත්‍ර සූත්‍ර | 745 | - එම - | 52 | 693 |

**(ආ) බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්**

දෙපාර්තමේන්තුව විසින් ඇතැම් වත්කම් අවිධිමත් ලෙස බාහිර පාර්ශවයන් වෙත මුදාහැර තිබුණු අවස්ථා නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| වත්කම් වර්ගය | වත්කම් ලබාදී ඇති ආයතනය | වටිනාකම | කාල පරිච්ඡේදය |
|---|---|---|---|
| | | රු. | |
| ඉඩම් (හෙක්ටයාර) | පෞද්ගලික සමාගමක් | ලබා ගත නොහැක. | ලබා ගත නොහැක. |
| | රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව | 247,692 | -එම- |

**(ඇ) වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත්ව පරිහරණය කිරීම**

වෙනත් ආයතන සතුව තිබුණු සමහර වත්කම් විධිමත් අනුමැතියකින් තොරව දෙපාර්තමේන්තුව විසින් භාවිතයට ගෙන තිබුණු අවස්ථා නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| | වත්කම් වර්ගය | වත්කම අයත්ව තිබූ ආයතනය | සංඛ්‍යාව, ඒකක ගණන හෝ ප්‍රමාණය | වටිනාකම | කාල පරිච්ඡේදය |
|---|---|---|---|---|---|
| | ---------------- | --------------- | --------------- | ------------ | ---------- |
| | | | | රු. | |
| (i) | ඉඩම් | ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය | සොයාගත නොහැක. | සොයාගත නොහැක. | සොයාගත නොහැක. |
| (ii) | ගොඩනැගිලි | -එම- | -එම- | -එම- | -එම- |
| (iii) | මෝටර් වාහන | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - අම්පාර | -එම- | -එම- | 2014 වර්ෂයේ සිට |
| | | ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය | -එම- | -එම- | සොයාගත නොහැක. |

**(ඈ) බේරුම් නොකළ බැරකම්**

**--------------------------------**

දෙපාර්තමේන්තුව විසින් 2015 දෙසැම්බර් 31 දිනට වර්ෂයට අඩු කාලයක සිට පැවැත එමින් තිබුණු අවස්ථා 676 කට අදාළව බේරුම් නොකළ බැරකම්වල එකතුව රු.20,923,355 ක් වී තිබුණි.

**3.10 අනුකූල නොවීම්**

**------------------**

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

**----------------------------------------------**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
| --- | --- | --- |
| | රු. | |
| **(අ) ව්‍යවස්ථාපිත විධිවිධාන** | | |
| (i) 2003 අංක 22 දරන බීජ පනතේ 18 වගන්තිය | - | නියෝග සාදා ගැසට් පත්‍රයේ පල කිරීමෙන් අනතුරුව පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබාගෙන පනතෙන් නියම කර ඇති කාර්යයන් ඉටු කළයුතු වුවද, 2010 වර්ෂයේ සිට කෙටුම්පත් කරන ලද නියෝග සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අනුමත කරගෙන නොතිබුණි. |
| (ii) 1994 අංක 06 දරන පළිබෝධනාශක පාලනය කිරීමේ සංශෝධන පනතේ 13 වගන්තිය | - | බලයලත් නිලධාරියෙකු විසින් නිකුත් කරන ලද සහතිකයක බලය යටතේ හැර කිසිම තැනැත්තෙකු විසින් යම් පළිබෝධනාශකයක් විකිණීම නොකළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ ක්‍රියාත්මක අලෙවිසැල් 1,405 න් 281 ක් වෙළඳ සහතික පත්‍ර ලබා නොගෙන අලෙවි කටයුතුවල නියැලී තිබුණි. |
| **(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** | | |
| XV පරිච්ඡේදයේ 4.7 වගන්තිය | 5,655,567 | ශිෂ්‍යත්ව ගිවිසුම් කොන්දේසි කඩකිරීම මත නිලධාරීන් 04 දෙනෙකුගෙන් අයවිය යුතු මුදල් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අයකර ගෙන නොතිබුණි. |

**(ඈ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය**

----------------------------------

| | | | |
|---|---|---|---|
| (i) | මුදල් රෙගුලාසි 216 | 7,735,709 | වාර්ෂික අයවැය ඇස්තමේන්වෙන් සලසා ඇති ප්‍රතිපාදන ප්‍රමාණය ඉක්මවා කටයුතු කිරීම වැලැක්වීමේ අදහසින් වර්ෂයට අදාළ වියදම් විලම්භනය නොකළ යුතු වුවත්, ප්‍රතිපාදන සලසා නොතිබුණු වැය විෂයයන් 06 කට අදාළ වියදම් සමාලෝචිත වර්ෂයේදී නිරවුල් නොකර එළඹෙන ඊලග වර්ෂයේදී ගෙවීම් කිරීම සඳහා රඳවා ගෙන තිබුණි. |
| (ii) | මුදල් රෙගුලාසි 509(1) | 139,814,025 | අත්තිකාරම් ගිණුම් කටයුත්තෙහි ප්‍රාග්ධන වත්කම්වල ක්ෂය ප්‍රමාණය අදාළ මුදල් වර්ෂය සඳහා භාණ්ඩාගාරයේ පොත් පියවීමට පෙර "පොදු තැන්පතු ගිණුම - ක්ෂය සංචිත අරමුදලට" බැර කිරීම පිණිස භාණ්ඩාගාරය වෙත දැණුම් දී තත්කාර්යයට අදාළ ගිණුම් පොත්වල වත්කමක් වශයෙන් සටහන් කර ශේෂපත්‍රයේ පෙන්නුම් කර නොතිබුණි. |
| (iii) | මුදල් රෙගුලාසි 753(2) | 355,000 | භාණ්ඩ ලැබුණු කල්හි ලැබීම් ඇණවුම් පිළියෙල කර මුල් පිටපත නිකුත් කළ නිලධාරියාට යැවිය යුතු නමුත්, ගන්නෝරුව ආහාර පර්යේෂණ ඒකකය මගින් නිකුත් කළ විද්‍යුත් තරාදියක් හා ප්ලාස්ටික් කූඩා 50 ක් සඳහා සහ බතලගොඩ වී පර්යේෂණ හා සංවර්ධන ආයතනය මඟින් අවස්ථා 16 කදී නිකුත් කළ බීජ සහ වෙනත් ද්‍රව්‍යය වෙනුවෙන් ලැබීම් නියෝග ගෙන්වාගෙන නොතිබුණි. |

(iv) මුදල් රෙගුලාසි 880 හා 881 - රජයේ මුදල් භාරගැනීම හෝ භාරව සිටින නිලධාරීන් ස්වකීය රාජකාරි කටයුතු අවංකව ඉටුකරන බවට 612 අධිකාරිය වන රජයේ නිලධාරින්ගේ ඇප ආඥා පනතට අනුකූලව ඇප තැබිය යුතු වුවද, ප්‍රධාන කාර්යාලයේ, බතලගොඩ වී පර්යේෂණ හා සංවර්ධන ආයතනයේ, ගන්නෝරුව ශ්‍රව්‍ය දෘෂ්‍ය මධ්‍යස්ථානයේ සහ ආහාර පර්යේෂණ ඒකකයේ නිලධාරින් අවස්ථා 429 කදී ඇප තබා නොමැති බව නියැදි පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

**(ඇ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ**

---------------------------

2009 ජුනි 17 දිනැති අංක 09/2009(1) දරන චක්‍රලේඛය - සියලුම රාජ්‍ය නිලධාරීන් තම පැමිණීම හා පිටවීම ඇඟිලි සළකුණු යන්ත්‍රය මගින් සටහන් කළයුතු වුවද, බිබිල උද්‍යාන බෝග පුහුණු හා සංවර්ධන ආයතනයේ නිලධාරීන් 12 ක් අවස්ථා 12 කදී තම පිටවීම සනාථ කර නොතිබුණු බව නියැදි පරීක්ෂාවේදී අනාවරණය විය.

- බිදුණුවැව මී මැසි සංවර්ධන ඒකකයේ වසර 04 කට අධික කාලයක්ද (සවිකළ දින සිට), පොළොන්නරුව නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (අන්තර් පළාත්) කාර්යාලයේ වසර 03 කට අධික කාලයක්ද ඇඟිලි සළකුණු යන්ත්‍ර නියමිත පරිදි ක්‍රියාත්මක තත්ත්වයේ නොපැවතීම නිසා ඉහත චක්‍රලේඛයට අනුකූලව කටයුතු කර නොතිබුණි.

**(v) රාජ්‍ය මුදල් චක්‍රලේඛ**

| | | |
|---|---|---|
| 2015 ජුලි 10 දිනැති 02/2015 චක්‍රලේඛය | - | නියැදි විගණන පරීක්ෂාවට අනුව බතලගොඩ වී පර්යේෂණ හා සංවර්ධන ආයතනයේ වාහන 03 ක් වර්ෂ 06 කට වැඩි කාලයක සිටද, ගන්නෝරුව ආහාර පර්යේෂණ ඒකකයේ වාහන 03 ක් වර්ෂ 1 ක සිට වර්ෂ 2 ක් අතර කාල පරාසයක සිටද ගර්හිතව පැවැති අතර, 2015 දෙසැම්බර් 31 දින වන විටත් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර අපහරණය කිරීම සිදු කර නොතිබුණි. |

### 3.11 විදේශාධාර ව්‍යාපෘති

සමාලෝචිත වර්ෂයේදී දෙපාර්තමේන්තුව විසින් විදේශ මූල්‍යාණය යටතේ ව්‍යාපෘති 21ක් ක්‍රියාත්මක කර තිබුණි. ව්‍යාපෘති ගිවිසුම් අනුව එහි ඇස්තමේන්තුගත පිරිවැයවල එකතුව රු.75,008,500 ක් වී තිබුණු අතර, එම ව්‍යාපෘති වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.60,726,012 ක් උපයෝජනය කර තිබුණි.

### 3.12 කාර්යසාධනය

2015 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

**(අ) ප්‍රමාණවත් ලෙස ඉටු නොකළ ප්‍රධාන කාර්යයන්**

දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් ප්‍රමාණවත් ලෙස ඉටුනොකර තිබුණු අතර, එසේ නිරීක්ෂණය වූ අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(i) ඒ ඒ කළාපවල දේශගුණික තත්ත්වයන්ට සුදුසු වන ආකාරයේ වී ප්‍රභේද පර්යේෂණ තුළින් හඳුන්වා දී තිබුණි. නමුත් ඒවා ඒ ඒ ප්‍රදේශයන්හි භාවිතා නොකරන බව මෑත කාලීන සමීක්ෂණ මගින් තහවුරු වී තිබුණු අතර ඒවා ගොවීන් අතර ප්‍රචලිත කිරීම වෙනුවෙන් ඵලදායි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. 1987 වර්ෂයේදී හඳුන්වා දුන් BG 300 හා 1992 වර්ෂයේදී හඳුන්වා දුන් BG 352 යන වී ප්‍රභේද දෙක පමණක් වර්තමානය වන විට ගොවීන් අතර බහුලව ප්‍රචලිතව වී තිබුණි.

(ii) බතලගොඩ වී පර්යේෂණ හා සංවර්ධන ආයතනයේ ගස් 1,500 කින් සමන්විත පොල් වගාවේ හා පස්යාල උද්‍යාන විද්‍යා පර්යේෂණ ගොවිපලේ ගස් 610 කින් සමන්විත පොල් වගාවේ එක් ගසක වාර්ෂික සාමාන්‍ය ඵලදාව පිළිවෙලින් පොල් ගෙඩි 19ක් හා 22 ක් වැනි ඉතා පහළ මට්ටමක පැවතුණි.

(iii) පොළොන්නරුව නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (අන්තර් පළාත්) කාර්යාලයට අයත්, පුහුණු කටයුතු සඳහා යොදාගන්නා වී, දොඩම්, පේර, බඩඉරිඟු, කෙසෙල්, වම්බටු, මුං හා පොල් යන බෝගවල ක්ෂේත්‍ර ආදර්ශනවල රෝග පැවතීම, ගස් වර්ධනය වී නොතිබීම, පත්‍ර කහ පැහැ ගැන්වීම ආදි තත්ත්වයන් නිරීක්ෂණය විය.

(iv) බිම්මල් වගාව සම්බන්ධව පුහුණුව ලබාදීමේ අරමුණින් 2013 වර්ෂයේ පස්යාල උද්‍යාන විද්‍යා පර්යේෂණ ගොවිපලේ බිම්මල් බීජ නිෂ්පාදන ඒකකයක් පවත්වාගෙන ගොස් තිබුණද 2015 වර්ෂයේදී පුහුණු පන්ති දිනකට පැය 05 ක් බැගින් වූ දින 07 ක් පමණක් පවත්වා තිබුණි.

(v) ගොවිපල නඩත්තුව හා බීජ අලෙවි අත්තිකාරම් ගිණුම යටතේ පවතින ගොවිපල 24 කින් ගොවිපල 12 කම එකතුව රු.82,608,551 ක් වූ අලාභයක් ලබා තිබුණි.

(vi) කුණ්ඩසාලේ රජයේ බීජ නිෂ්පාදන ගොවිපලේ හානිවූ වගාවන්ට අදාළව, වගාව පිහිටුවීමේ සිට අලාභහානි සිදුවන තෙක් වූ වියදම මුළු වියදමට අනුපාත කිරීමේදී 2012/13, 2013/14, 2014/15 මහ කන්නවලදී පිළිවෙලින් සියයට 62 ක්, සියයට 61 ක්, සියයට 60 ක් හා 2012, 2013 යල කන්නවලදී පිළිවෙලින් සියයට 88 ක් හා සියයට 46 ක් වැනි ඉහළ ප්‍රතිශතයක් ගෙන තිබුණි. වගා හානි සඳහා බලපෑ මූලික හේතූන් මොනවාද යන්න සොයා බලා හානිය අවම කර ගැනීමට කළමනාකරණය කටයුතු කර නොතිබුණි.

(vii) පර්යේෂණ ගොවිපලක් ලෙස නම්කර ඇති පස්යාල උද්‍යාන විද්‍යා පර්යේෂණ ගොවිපල විසින් 2010 වර්ෂයේ රඹුටන් වගාවට අදාළ එක් පර්යේෂණයක් ආරම්භකර පවත්වාගෙන යන අතර 2015 වර්ෂයේ ගස්ලබු වගාව පිළිබඳව ආරම්භ කර තිබූ පර්යේෂණයද ආරම්භයේදීම අසාර්ථක වී තිබුණි. ඊට අමතරව වෙනත් කිසිදු පර්යේෂණ වැඩසටහනක් ආරම්භ කර නොතිබුණි.

**(ආ) සැලසුම් කිරීම**

----------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) තාක්ෂණික ක්‍රියාකාරි සැලැස්මේ ඇතුළත් ඉලක්ක වාර්ෂික ප්‍රගති වාර්තා සමඟ සැසඳීමේදී බිදුණුවැව මී මැසි සංවර්ධන ඒකකයේ , බිබිල උද්‍යාන බෝග පුහුණු හා සංවර්ධන ආයතනයේ, පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් කාර්යාලයේ හා අම්පාර, හම්බන්තොට, පොළොන්නරුව, හසලක, අනුරාධපුරය සහ මොණරාගල යන අන්තර් පළාත් බල ප්‍රදේශයන්හි ප්‍රගතිය ඉතා පහළ මට්ටමක පැවතුණි.

(ii) පැළෑටි සංරක්ෂණ සේවයේ ප්‍රධාන කාර්යයන් ඉටුකර ගැනීමේදී සමාලෝචිත වර්ෂයේ ක්ෂේත්‍ර ගොවි ආදර්ශන පැවැත්වීම, ඉලක්කගත නිලධාරීන් පුහුණු කිරීම, අම්පාර සහ මොණරාගල දිස්ත්‍රික්කවල බෝග සායන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම යන ක්‍රියාකාරකම් සිදුකර නොතිබුණි. තවද එළවළු වගාව සම්බන්ධව ක්ෂේත්‍ර මට්ටමේ සමෝධානික පළිබෝධ කළමනාකරණ ක්‍රම (IPM) ක්‍රියාත්මක කිරීම, මෙහෙයවීම හා ඇගයීම පැළෑටි සංරක්ෂණ සේවයේ ප්‍රධාන කාර්යයන් වූ අතර ඊට අදාළව සමාලෝචිත වර්ෂයේ ආදර්ශන කිසිවක් පවත්වා නොතිබුණි. එසේම කොළ එළවළු වගාවට අදාළව

ක්ෂේත්‍ර මට්ටමේ ව්‍යාප්ති නිලධාරීන් 250 ක් පුහුණු කිරීමට ඉලක්ක කර තිබුණද කිසිදු නිලධාරියෙක් පුහුණු කර නොතිබුණ අතර කිසිම ක්ෂේත්‍ර පරීක්ෂාවක් සිදුකර නොතිබුණි.

**3.13 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු**

**ගැලපුම් කළයුතු ශේෂ**

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් 2015 දෙසැම්බර් මාසය සඳහා පිළියෙල කර තිබුණු බැංකු සැසඳුම් ප්‍රකාශවල දැක්වුණු ගැලපුම් පිළිබඳ විග්‍රහයට අනුව අනාවරණය වූ තොරතුරු පහත දැක්වේ.

| | ගැලපුම් පිළිබඳ විස්තරය | කාල විශ්ලේෂණය | | | එකතුව |
|---|---|---|---|---|---|
| | | මාස 06 ට වැඩි වර්ෂ 01 ට අඩු | වර්ෂ 01 ට වැඩි 03 ට අඩු | වර්ෂ 03 ට වැඩි | |
| | | රු. | රු. | රු | රු. |
| (අ) | උපලබ්ධි නොවූ තැන්පතු | 80,104 | 104,349 | 1,958 | 186,411 |
| (ආ) | නිකුත් කළ නමුත් ගෙවීම් සඳහා ඉදිරිපත් නොකළ චෙක්පත් | 585,530 | 639,381 | - | 1,224,911 |
| (ඇ) | හඳුනා නොගත් හර | 157,813 | 764,672 | 35,757 | 958,242 |
| (ඇ) | හඳුනා නොගත් බැර | 118,571 | 290,709 | - | 409,280 |

**3.14 අවිධිමත් ගනුදෙනු**

**රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියා පරිපාටියෙන් බැහැරවීම**

ගන්නොරුව උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනයේ සහ කුණ්ඩසාලේ බීජ නිෂ්පාදන ගොවිපලේ බීජ නිෂ්පාදන ඒකකයේ එකතුව රු.4,513,363 ක අස්තමේන්තු ගත වටිනාකමක් මත සිදුකළ ඉදිකිරීම් කටයුතු 02 කට අදාළව රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.12, 3, 7.10, 8.9.3, 8.12.2 සහ 8.13.4 යන මාර්ගෝපදේශවලට අනුකූල නොවන ලෙස කටයුතු කර තිබුණි.

**3.15 අනාර්ථික ගනුදෙනු**

බිදුණුවැව මී මැසි සංවර්ධන ඒකකය මගින් ජාතික මී මැසි පාලන සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා 2014 වර්ෂයේදී රු.999,846 ක් වැය කර අවශ්‍ය ද්‍රව්‍ය මිලදී ගෙන තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එම ද්‍රව්‍යය ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

## 3.16 කළමනාකරණ දුර්වලතා

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේදී අවස්ථා 408 කදී රු.11,585,917 ක් වැයකර විවිධ විදේශ පුහුණු පාඨමාලා සඳහා නිලධාරීන් සහභාගි කරවා තිබුණද, පුහුණුවෙන් පසු පාඨමාලාවට අදාළ නොවන ක්ෂේත්‍රයන්හි කාර්යයන් පවරා තිබුණි.

(ආ) 2014 දෙසැම්බර් 19 දින දෙපාර්තමේන්තුව විසින් පෞද්ගලික සැපයුම්කරුවකුගෙන් රු.773,450 කට මිලදී ගෙන තිබූ අතුරු යත් ගෑමේ යන්ත්‍ර 31 න්, යන්ත්‍ර 08 ක් වගකීම් කාලය අවසන් වීමෙන් පසුව ඒකකවලට ලබාදී තිබූ අතර, තවත් යන්ත්‍ර 23 ක් වගකීම් කාලය අවසන් වීමට දින 10 ට අඩු කාලයක් තිබියදී ලබාදී තිබුණි.

## 3.17 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2015 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 985 | 482 | 503 |
| (ii) | තෘතියික මට්ටම | 308 | 65 | 243 |
| (iii) | ද්විතියික මට්ටම | 3,691 | 2,658 | 1,033 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 6,638 | 5,958 | 680 |
| (v) | වෙනත් (අනියම් /තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) | 959 | 959 | - |
| | **එකතුව** | **12,581** | **10,122** | **2,459** |